# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2470/54 – 2026 ජනවාරි මස 09 වැනි සිකුරාදා – 2026.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2026 අංක 01 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/15/2018/VE/50.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* ARA/LND/ACQVI/D3/51.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

2026 ජනවාරි මස 08 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, මැදදුම්බර.

II. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තෙල්දෙණිය මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලිස්පත්තුව බටහිර කෝරළේ සුළු කොට්ඨාසයේ, බඹරගහදෙණිය (818) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අඹුරුවලගම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක Maha/MDD/2018/319 හා 2018.12.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'C' වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 4.0523 ක් වූ අඹුරුගමවත්ත නමැති ඉඩම සඳහා මායිම්:

01. **කැබලි අක්ෂර 'C' – අඹුරුගමවත්ත – ප්‍රමාණය: හෙක්. 4.0523**

උතුරට: මාර්ගය, අඹුරුවල කඳුර සහ පී. ඩී. වීරසේකර හිමිකම් කියන අක්කර 50; නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ගය, කේ. පී. යසවති හිමිකම් කියන කේපිවත්ත ජනපදය සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

EOG 01 – 0090